Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2021 ඔක්තෝබර් 24, කොළඹ

## නෙස්ලේ ලංකා නව කළමනාකාර අධ්‍යක්ෂක ලෙස ජේසන් ඇවන්සෙනයා මහතා පත්වෙයි

නෙස්ලේ ලංකා සමාගමේ නව කළමනාකාර අධ්‍යක්ෂකවරයා ලෙස 2021 ඔක්තෝබර් 1 වැනිදා සිට ජේසන් ඇවන්සෙනයා මහතා පත් කර තිබේ. ඒ අනුව ඔහු ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ නෙස්ලේ සමාගම් භාරව කටයුතු කරනු ඇත. නෙස්ලේ ලංකාහි කළමනාකාර අධ්‍යක්ෂකවරයා ලෙස එතෙක් කටයුතු කළ ෆැබ්රිස් කැවලින් මහතා ස්විට්සර්ලන්තයේ පිහිටි නෙස්ලේ ප්‍රධාන කාර්යාලයේ ආසියානු, ඕෂනියා සහ අප්‍රිකානු කළමනාකරණ කණ්ඩායම තුළ පෝෂණ ආශ්‍රිත ව්‍යාපාර අංශය භාරව කටයුතු කරනු ලැබේ.

ජේසන් ඇවන්සෙනයා මහතා, නෙස්ලේ සමාගම තුළ විවිධ රටවල, එනම් ස්විට්සර්ලන්තය, පිලිපීනය, ඉන්දුනීසියාව සහ පාකිස්ථානය හි, වසර 24 කට වැඩි කාලයක අත්දැකීම් සමඟ පැමිණෙන අතර, පෝෂණ හා කිරි ආශ්‍රිත ව්‍යාපාර අංශයේ මනා පසුබිමක් ඇත. නෙස්ලේ ලංකාහි කළමනාකාර අධ්‍යක්ෂක ධූරය භාර ගැනීමට පෙර ඔහු Nestlé Pakistan සහ Nestlé Afghanistan හි පෝෂණ හා කිරි ආශ්‍රිත ව්‍යාපාර අංශයේ ව්‍යාපාර විධායක නිලධාරී (BEO) ලෙස කටයුතු කළේය. එහිදී ඔහු නිෂ්පාදන කළමනාකරණය, නවෝත්පාදන, ඩිජිටල් සේවා විශිෂ්ටත්වය සහ කණ්ඩායම් සංවර්ධනය පිළිබඳ මනා මෙහෙයවීමක් කර ඇත. ඇමරිකා එක්සත් ජනපදයේ ෆෝඩම් පශ්චාද් ව්‍යාපාර අධ්‍යයන ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාද් උපාධියක් හිමි ඔහු, පිලිපීනයේ De La Salle විශ්ව විද්‍යාලයේ ව්‍යවහාරික ආර්ථික විද්‍යා උපාධිධාරියෙකු ද වේ.

---

**Contact:**

| | | | |
|---|---|---|---|
| Corp. Public Affairs | Damitha Kulatunga | +94777915949 | Damitha.Kulatunga@lk.nestle.com |